# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1997 අංක 24 දරන
# දේශීය ආදායම් (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 1997 සැප්තැම්බර් මස 04 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1997 සැප්තැම්බර් මස 05 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල : රු. 27.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 4.60 යි.**

## 1997 අංක 24 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1997 සැප්තැම්බර් මස 04 වන දින.]

එල්. ඩී.-ඕ. 2/97.

## 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මේ පනත 1997 අංක 24 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. 1984 අංක 14 දරන පනතින් සංශෝධිත (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ :– — 1979 අංක 28 දරන පනතේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ (iv) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් :–

"(v) 1980 අංක 46 දරන සේවානියුක්තයන්ගේ භාර අරමුදල පනතින් පිහිටුවන ලද සේවානියුක්තයන්ගේ භාර අරමුදලින් ගෙවන ලද යම් මුදලක්.";

(2) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ අතුරු විධානයේ—

(i) (i) වන අනුඡේදයේ "මේ ප්‍රමාණ දෙකින් වඩා අඩු ප්‍රමාණයට ; සහ" යන වචන වෙනුවට "මේ ප්‍රමාණ දෙකින් වඩා අඩු ප්‍රමාණයට ;" යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) (ii) වන අනුඡේදය වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :–

""(ii) 1984 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1997 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල විස්තර කරන ලද ලාභවලින් සියයට විසිපහක් හෝ රුපියල් හතළිස් අට දහසක් යන මේ ප්‍රමාණ දෙකින් වඩා අඩු ප්‍රමාණයට : සහ"

(iii) (ii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් :-

"(iii) 1997 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් එක් ලක්ෂ විසි දහසකට".

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** 1996 අංක 16 දරන පනතින් සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ (අ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ ඡේදයේ (LXXi) අනුඡේදයේ "ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනයේ ලාභ සහ ආදායම"; සහ යන වචන හා ඉලක්කම් වෙනුවට "ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනයේ ලාභ සහ ආදායම" යන වචන ආදේශ කිරීමෙන් :

(2) ඒ ඡේදයේ (LXXii) වන අනුඡේදයේ "1996 අංක 1 දරන ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ලාභ සහ ආදායම.". යන වචන හා ඉලක්කම් වෙනුවට "1996 අංක 1 දරන ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ලාභ සහ ආදායම්;"; යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(3) ඒ ඡේදයේ (LXXii) අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් :-

"(LXXiii) 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ලාභ සහ ආදායම්.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** 1995 අංක 27 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ : -

(1) ඒ උපවගන්තියේ (ආආ) ඡේදයේ "තිල පඩිනඩි හෝ 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් යම් සේවානියුක්තියකින් ලැබෙන ලාභ වශයෙන් –" යන වචන හා ඉලක්කම් වෙනුවට "තිල පඩිනඩි හෝ යම් විශ්‍රාම වැටුපක් හෝ 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් යම් සේවානියුක්තියකින් ලැබෙන ලාභ වශයෙන්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;";

(2) ඒ උපවගන්තියේ (ආආආ) ඡේදයේ "1993 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක්" යන වචන හා ඉලක්කම් වෙනුවට "1993 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසු, එහෙත් 1997 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් :

(3) ඒ උපවගන්තියේ (ඕ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

(ඕ) යම් පුද්ගලයකුගේ මුළු ව්‍යවස්ථාපිත ආදායම–

(i) (අ) 1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1986 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී රුපියල් තිස් දහසක් ;

(ආ) 1986 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා රුපියල් හතලිස් දෙදහසක් ;

(ඇ) 1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් හතලිස් පන් දහසක් ;

(ඈ) 1991 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1997 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් හැට දහසක් : සහ

(ඉ) 1997 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් එක්ලක්ෂ පණස් දහසක් නොඉක්මවන්නා වූ සේවානියුක්තියෙන් ලබන ලාභවලින් සහ ආදායමෙන් : සහ

(ii) සේවානියුක්තිය හැර වෙනත් සියලු ප්‍රභවයන්ගෙන් ලබන ලාභ සහ ආදායම -

(අ) 1991 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් එක් දහස් දෙසියයක් නොඉක්මවන්නා වූ ලාභවලින් සහ ආදායමෙන් පමණක් :

(ආ) 1991 අප්‍රේල් මස '1 වන දින හෝ ඉන් පසු එහෙත් 1997 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් දෙදහස් හාර සියයක් නොඉක්මවන්නා වූ ලාභවලින් සහ ආදායමෙන් පමණක් : සහ

(ඇ) 1997 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් හාර දහස් අට සියයක් නොඉක්මවන්නා වූ ලාභවලින් සහ ආදායමෙන් පමණක්

සමන්විත වන්නේ නම්, ඒ පුද්ගලයාට හෝ ඒ පුද්ගලයාගේ ආදායම සමග ස්වකීය මුළු ව්‍යවස්ථාපිත ආදායම එකතු කරනු ලැබූ යම් දරුවකුට ව්‍යුත්පන්න වූ, උද්ගතවන්නා වූ හෝ උපචිත වන්නා වූ ඒ තක්සේරු වර්ෂය සඳහා වූ සේවානියුක්තිය හැර වෙනත් සියලු ප්‍රභවයන්ගේ එකතුව -

(අ) 1991 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර අවසන් වූ යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් එක් දහස් දෙසියයක් :

(ආ) 1991 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු එහෙත් 1997 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් දෙදහස් හාර සියයක් : සහ.

(ඇ) 1997 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් හාර දහස් අටසියයක්

නොඉක්මවන්නා වූ ලාභ සහ ආදායම,

තවද ඒ අනුව මේ ඡේදය යටතේ නිදහස් කරන ලද යම් ලාභ සහ ආදායම සම්බන්ධයෙන් යම් තක්සේරු වර්ෂයක දී ඒ පුද්ගලයා විසින් අඩු කිරීමෙන් හෝ අන්‍යාකාරයකින් යම් ආදායම් බද්දක් ගෙවා ඇති අවස්ථාවක, ඒ තක්සේරු වර්ෂයේ අවසානයේ සිට වර්ෂ තුනක් ඇතුළත ඒ පුද්ගලයා විසින් තත් කාර්ය සඳහා ලිඛිතව කරනු ලබන ඉල්ලීමක් මත ඒ බද්ද ඔහුට ආපසු ගෙවනු ලැබිය යුතු ය :

(4) ඒ උපවගන්තියේ (ග) ඡේදයේ "කාලසීමාවක් සඳහා ඒ අරමුදලට ව්‍යුත්පන්න වූ ආදායම නියෝජනය කරනු ලබන කොටස : සහ" යන වචන වෙනුවට "කාලසීමාවක් සඳහා ඒ අරමුදලට ව්‍යුත්පන්න වූ ආදායම නියෝජනය කරනු ලබන කොටස;" යන වචන ආදේශ කිරීමෙන් :

"(5) ඒ උපවගන්තියේ (ච) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ච) 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත යටතේ ඇති කරන ලද යම් සමාගමක යම් සේවා නියුක්තියකින් යම් සේවානියුක්තයකු විශ්‍රාම ගන්නා අවස්ථාවේ දී ඔහුට ගෙවන ලද 4(1) වන වගන්තියේ (ඇ) ඡේදයේ සඳහන්, අවස්ථාවෝචිත පරිදි, යම් රාජ්‍ය සංස්ථාවක හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතනයක 1997 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව සේවා කාලයට ආරෝපණය කරනු ලබන යම් මුදල් කොටසක් : සහ"

(6) ඒ උපවගන්තියේ (ච) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :–

"(ජ). (1) වන උපවගන්තියේ (ආආ) ඡේදයේ (ii) වන අනුඡේදයේ සඳහන් යම් රාජ්‍ය සංස්ථාවක් හැර වෙනත් යම් රාජ්‍ය සංස්ථාවක යම් සේවානියුක්තියකින් යම් සේවානියුක්තකයකු

විශ්‍රාම ගන්නා අවස්ථාවේ දී ඔහුට ගෙවනු ලබන 4(1) වගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් යම් මුදලක ඒ සේවානියුක්තයාගේ ඒ රාජ්‍ය සංස්ථාවේ 1997 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව වූ සේවා කාලයට ආරෝපණය කළ හැකි කොටස.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5**. 1991 අංක 49 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

"(ඇඇ) ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ශ්‍රී ලංකා ආණ්ඩුවට විදේශ ව්‍යවහාර මුදලින් දෙන ලද ණයක් ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍ය යයි අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ඇත්නම්, ඒ ණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් නිකුත් කරන ලද යම් සුරැකුමකින්, නෝට්ටුවකින් හෝ කූපනයකින් ඒ තැනැත්තාට හෝ හවුල් ව්‍යාපාරයට උපචිත වන පොලිය :".

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6**. 1996 අංක 16 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියේ (ආ) ඡේදයෙහි "17ඊ, 17ඔ සහ 18 වන" වචන හා ඉලක්කම් වෙනුවට "17ඒ, 17ඒඒ, 17ඔ, 17ඔඔ, 18 වන" වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7**. 1988 අංක 8 දරන පනතින් සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයෙහි "මේ උපවගන්තියේ (ආ) ඡේදය යටතේ, ආදායම් බද්දෙන්" යන වචන වෙනුවට "මේ උපවගන්තියේ (ආ) ඡේදය හෝ (ආආ) ඡේදය යටතේ ආදායම් බද්දෙන්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

**8**. 1994 අංක 21 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන් :

(2) ඒ වගන්තියේ නැවත අංක යෙදූ (1) වන උපවගන්තියේ

(අ) ඡේදයෙහි–

(අ) (xxii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන් :–

"(xxiiඅ) ලියාපදිංචි කළ ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද සහ යම් තැනැත්තකු විසින් ද්විතීයික වෙළෙඳපොලෙහි දරනු ලබන යම් භාණ්ඩාගාර බැඳුම්කර, ලියාපදිංචි කළ ස්කන්ධ හෝ වෙනත් යම් සුරැකුම්පත් ඒ තැනැත්තා විසින් විකිණීමෙන් :";

(ආ) (xxiii) වන අනුඡේදයෙහි "අයිතිවාසිකම් නිකුතුවක් යටතේ ලැබුණු යම් කොටසක අයිතිවාසිකමක්" යන වචන වෙනුවට "අයිතිවාසිකම් නිකුතුවක් හෝ ප්‍රසාද නිකුතුවක් යටතේ ලැබුණු යම් කොටසක අයිතිවාසිකමක්" යන වචන ආදේශ කිරීමෙන් :

(3) ඒ වගන්තියේ නැවත අංක යෙදූ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් :–

"(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ (xxii) සහ (xxiiඅ) අනුඡේදවල කාර්ය සඳහා, "ප්‍රාග්ධන ලාභ" යන්නෙන් 7 වන වගන්තියේ (2) වන හා (4) වන උපවගන්තිවල විධිවිධාන අනුව ගණන් බලනු ලබන ප්‍රාග්ධන ලාභයෙහි, ඒ බිල්පත්‍රය, බැඳුම්කරය, ස්කන්ධය හෝ වෙනත් සුරැකුම්පත විකිණීම නොකර කල් පිරෙන තෙක් ඒ තැනැත්තා විසින් දැරුවේ නම්, ඒ තැනැත්තාට ඒ බිල්පත්‍රය, බැඳුම්කරය, ස්කන්ධය හෝ වෙනත් සුරැකුම්පතක් සම්බන්ධයෙන් උපචිත විය හැකිව තිබූ පොලියෙන් එකී බිල්පත්‍රය, බැඳුම්කරය, ස්කන්ධය හෝ වෙනත් සුරැකුම්පත ඒ තැනැත්තා විසින් දරන ලද කාලයට ආරෝපණය කළ හැකි කොටස ඉක්මවන අතිරික්තයක් අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 15ආ වගන්තිය ඇතුළත් කිරීම.

**9**. ප්‍රධාන ප්‍රඥප්තියේ 15අ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරන අතර ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 15ආ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :–

යම් වාසික ආගන්තුකයකුගේ ඇතැම් ලාභ හා ආදායම් ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

15ආ. (1) යම් වාසික ආගන්තුකයකුගේ–

(අ) ශ්‍රී ලංකාවේ දී උද්ගත වන්නා වූ හෝ ව්‍යුත්පන්න වන්නා වූ ලාභ සහ ආදායම් නොවන; සහ

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත යම් රටකින් විදේශ ව්‍යවහාර මුදල්වලින් ඔහු වෙත ප්‍රේෂණය කරනු ලබන මුදල් තැන්පත් කිරීම සඳහා වාණිජ බැංකුවක ඔහු විසින් විවෘත කරන ලද යම් ගිණුමක ඔහුගේ බැරට ඇති මුදල්වලින් උපචිත වන

ලාභ සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්යය සඳහා "වාසික ආගන්තුකයකු" යන්නෙන්, 1979 අංක 6 දරන වාසික ආගන්තුකයන් (බදු නිදහස් කිරීම) පනත යටතේ බදු නිදහසක් ප්‍රදානය කර ඇති තැනැත්තකු අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 17ඒඒ වන වගන්තිය ඇතුළත් කිරීම.

**10**. ප්‍රධාන ප්‍රඥප්තියේ 17ඒ වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරන අතර, ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි 17ඒඒ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :–

"දියුණු තාක්ෂණය භාවිත කරමින් සමාගමක් විසින් පවත්වාගෙන යනු ලබන කාර්මික ව්‍යවසායක ලාභ සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

17ඒඒ. (1) (2) වන උපවගන්තියේ සඳහන් යම් සමාගමක 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව වූ (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලබන යම් ලාභ සහ ආදායම නොවන) ලාභ සහ ආදායම, ඒ සමාගම විසින් ව්‍යාපාර කටයුතු කරගෙන යාම, ආරම්භ කරනු ලැබුවේ යම් තක්සේරු වර්ෂයක ද, ඒ තක්සේරු වර්ෂයේ ආරම්භයේ සිට අවුරුදු පහක කාලයක් ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන–

(අ) 1996 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු සංස්ථාගත කරනු ලැබූ :

(ආ) තත් කාර්ය සඳහා 1997 දෙසැම්බර් මස 31 වන දින හෝ එදිනට පෙර ඉදිරිපත් කරනු ලබන ලියවිල්ලකින් වූ ඉල්ලීමක් මත ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් මේ වගන්තිය අදාළ වන සමාගමක් වන බවට 1998 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ :

(ඇ) දියුණු තාක්ෂණය භාවිත කරමින්–

(i) යම් භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම හෝ සෑදීම සඳහා : හෝ

(ii) යම් සේවාවක් සැලැස්වීම සඳහා

යම් කාර්මික ව්‍යවසායයක් කරගෙන යාමෙහි පමණක් නිරතව සිටින :

(ඈ) සමාගම විසින් කරගෙන යන ව්‍යවසායයේ භාවිතය පිණිස යම් පිරියත, යන්ත්‍ර, සවිකිරීම් හෝ උපකරණ මිලට ගැනීම සඳහා 1998 දෙසැම්බර් මස 31 වන දිනට පෙර රුපියල් දස ලක්ෂ හතරකට නොඅඩු මුදලක් ආයෝජනය කර ඇති :

(ඉ) ස්වකීය ව්‍යාපාරික කටයුතු කරගෙන යාම ආරම්භ කළ දිනයේ සිට මාස හයකට නොවැඩි කාලයක් ඇතුළත දිනයක සිට ඒ සමාගමේ අධ්‍යක්ෂවරු හැර, සේවා නියුක්තයන් පනස් දෙනකුට අඩු නොවන සංඛ්‍යාවක් (1) වන උපවගන්තියේ සඳහන් අවුරුදු පහේ කාලසීමාව අවසන් වන තෙක් දිගට ම සේවයේ නියුක්ත කරන්නා වූ : සහ

(ඊ) කලින් පැවතියා වූ යම් ව්‍යාපාරයක් බෙදීමෙන්, ප්‍රතිසංස්කරණය කිරීමෙන් හෝ අත්කර ගැනීමෙන් පිහිටුවනු නොලැබුවා වූ

යම් සමාගමකට අදාළ විය යුතු ය:

මේ උපවගන්තියේ-

(i) "කාර්මික ව්‍යවසාය" යන යෙදුමට සත්ව පාලනය, ධීවර කටයුතු, සංචාරක කටයුතු හා සමෘද්ධි ජාතික වැඩ සටහන යටතේ ඇති කරන ලද ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති සඳහා වන යම් ව්‍යවසායක් ඇතුළත් වේ :

(ii) "සේවා නියුක්තයා" යන්නෙහි 16ඈ වගන්තියේ (2) වන උපවගන්තියේ ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 17ඔඔ වගන්තිය ඇතුළත් කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17ඔ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරන අතර, ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 17ඔඔ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:-

"දියුණු තාක්ෂණය අත්කර ගන්නා සහ භාවිත කරන ව්‍යවසායක ලාභ සහ ආදායම්, ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

17ඔඔ. (1) යම් භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම හෝ සෑදීම සඳහා හෝ යම් සේවයක් සැලසීම සඳහා වූ ද, (2) වන උපවගන්තියේ සඳහන් වන්නා වූ ද, යම් ව්‍යවසායක නව ප්‍රාග්ධන වියදමට ආරෝපණය කළ හැකි ලාභ සහ ආදායම්, අදාළ දිනයෙහි සිට ගණන් බලනු ලබන අවුරුදු පහක කාල පරිච්ඡේදයක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන—

(අ) අදාළ දිනයෙන් ආරම්භ වන මාස 12 ක කාල පරිච්ඡේදයක් ඇතුළත දියුණු තාක්ෂණය අත්කර ගැනීම සහ භාවිත කිරීම සඳහා රුපියල් මිලියන හතරකට නොඅඩු නව ප්‍රාග්ධන වියදමක් දරා ඇත්තා වූ ද;

(ආ) තත් කාර්ය සඳහා 1997 දෙසැම්බර් මස 31 වන දින හෝ ඊට පෙර ලියවිල්ලක් මගින් ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් මත, මේ වගන්තිය අදාළ වන ව්‍යවසායක් බවට ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් අමාත්‍යවරයා විසින් 1998 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර අනුමත කරනු ලැබුවා වූ ද ;

(ඇ) ඒ ව්‍යවසාය විසින් අදාළ දිනයෙන් අවසාන වන වර්ෂය ඇතුළත සේවයේ නියුක්ත කරගනු ලැබූ සේවා නියුක්තයන්ගේ සාමාන්‍ය සංඛ්‍යාවට වඩා පනස් දෙනකුට නොඅඩු සේවා නියුක්තයන් සංඛ්‍යාවක් අදාළ දිනයේ දී හෝ ඒ දිනයේ සිට මාස හයක් ඉකුත්වීමට පෙර සේවයේ නියුක්ත කර ගන්නා වූ සහ එකී සංඛ්‍යාව එකී අවුරුදු පහක කාල පරිච්ඡේදය ඉකුත් වන තෙක් දිගටම සේවයේ නියුක්ත කර ගන්නා වූ ද,

යම් ව්‍යවසායකට අදාළ විය යුතු යː

එසේ වුව ද, (1) වන උපවගන්තියේ සඳහන් එකී අවුරුදු පහ ඇතුළත යම් තක්සේරු වර්ෂයක් තුළ යම් අවස්ථාවක දී, ඒ එම ව්‍යවසායේ සේවයේ නියුක්ත කරගෙන සිටින්නා වූ සේවා නියුක්තයන්ගේ සංඛ්‍යාව, එකී සාමාන්‍ය සංඛ්‍යාවට වඩා පණහකින් වැඩි නොවන අවස්ථාවක, ඒ ව්‍යවසායේ (1) වන උපවගන්තියේ සඳහන් පරිදි වූ ඒ ලාභ සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් නොවිය යුතු ය.

මේ උපවගන්තියේ –

(i) "ව්‍යවසාය" යන යෙදුමට සත්ව පාලනය, ධීවර කටයුතු, සංචාරක කටයුතු, හෝ සමෘද්ධි ජාතික වැඩ

සටහන යටතේ ඇති කරන ලද යම් ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා වන ව්‍යවසායයක් ඇතුළත් වේ; තවද

(ii) "සේවා නියුක්තයා" සහ "සාමාන්‍ය සංඛ්‍යාව" යන යෙදුම්වල 16 ඇ වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ (iv) වන අනුඡේදයේ පිළිවෙලින් ඒවාට දී ඇති අර්ථය ම ඇත්තේ ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා –

(අ) යම් තක්සේරු වර්ෂයකට සහ යම් ව්‍යවසායකට අදාළව "නව ප්‍රාග්ධන වියදමට ආරෝපණය කළ හැකි ලාභ සහ ආදායම" යන යෙදුමින් –

(i) ඒ තක්සේරු වර්ෂයට අදාළ කළ හැකි ලෙස මේ ඡේදයේ උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති උචිත ප්‍රතිශතයෙන් අඩුකළ ඒ ව්‍යවසායේ ඒ තක්සේරු වර්ෂය සඳහා (යම් ප්‍රාග්ධන වත්කමක් විකිණීමෙන් හෝ යම් භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය මිලට ගෙන නැවත විකිණීමෙන් ලැබුණු යම් ලාභ සහ ආදායම් හැර) 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූල වූ ලාභ සහ ආදායමෙහි;

(ii) ඒ ව්‍යවසාය අදාළ දිනයට පෙර අවුරුදු තුනක් හෝ ඊට වැඩි කාල පරිච්ඡේදයක් ව්‍යාපාරය කරගෙන ගොස් ඇති අවස්ථාවක අදාළ දිනයට පෙරාතුව ම වූ අවුරුදු තුන සඳහා ගණිත් බලන ලද

නැතහොත්, ඒ ව්‍යවසාය අදාළ දිනයට පෙර අවුරුදු තුනකට අඩු කාලයක් ව්‍යාපාරය කරගෙන ගොස් ඇති අවස්ථාවක, එසේ ව්‍යාපාරය කරගෙන ගිය මුළු කාල පරිච්ඡේදය සඳහා ගණන් බලන ලද ඒ ව්‍යවසායේ (i) වන අනුඡේදයේ සඳහන් කර ඇති පරිදි වන ලාභ සහ ආදායමේ සාමාන්‍යය ඉක්මවන

අතිරික්ත ප්‍රමාණය අදහස් වේ.

එහෙත් එකී අතිරික්ත ප්‍රමාණය නව ප්‍රාග්ධන වියදමේ සහ අදාළ දිනයේ දී ඒ ව්‍යවසාය විසින් යම් භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමට හෝ සෑදීමට හෝ යම් සේවා සැලසීමට හෝ භාවිත කරනු ලබමින් තිබුණු –

(i) යම් පිරියත, යන්ත්‍ර, සවිකිරීම් හෝ උපකරණ; සහ

(ii) (යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් හැර) (i) වන අනුඡේදයේ සඳහන් නොවන යම් වත්කමක්

අත්කර ගැනීමේ අවස්ථාවේ දී වටිනාකමේ එකතුවට නව ප්‍රාග්ධන වියදම දරන අනුපාතය ම වන අනුපාතයක් (යම් ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් හෝ යම් භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය මිල දී ගෙන නැවත විකිණීමෙන් ලැබූ යම් ලාභ සහ ආදායම් හැර) (3) වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව එකී ව්‍යවසායේ එකී තක්සේරු වර්ෂය සඳහා වූ ලාභ සහ ආදායමට යම් මුදල් ප්‍රමාණයක් දරන්නේ ද, ඒ මුදල් ප්‍රමාණයෙන් සියයට එකසිය විස්සක් නොඉක්මවිය යුතු ය:

කෙසේ වුව ද යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් (2) වන උපවගන්තියේ සඳහන් ව්‍යවසාය 17ඊ වගන්තියේ හෝ 17ඔ වගන්තියේ

විධිවිධාන අදාළ වන ව්‍යවසායක් ද වන අවස්ථාවක, වැඩි සහනය සඳහා විධිවිධාන සලස්වන වගන්තියේ විධිවිධාන ඒ තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

උපලේඛනය

| තක්සේරු වර්ෂය | සියයට ප්‍රමාණය |
|---|---|
| අදාළ දිනය යෙදෙන තක්සේරු වර්ෂය | සියයට 10 යි |
| (එම තක්සේරු වර්ෂය මින් මතු මේ උපලේඛනයේ "අදාළ වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලැබේ) | |
| අදාළ වර්ෂයට ඉක්බිතිව එළඹෙන පළමුවන වර්ෂය | සියයට 10 යි. |
| අදාළ වර්ෂයට ඉක්බිතිව එළඹෙන දෙවන වර්ෂය | සියයට 12.5 යි |
| අදාළ වර්ෂයට ඉක්බිතිව එළඹෙන තුන්වන වර්ෂය | සියයට 15 යි |
| අදාළ වර්ෂයට ඉක්බිතිව එළඹෙන හතරවන වර්ෂය | සියයට 17.5 යි |
| අදාළ වර්ෂයට ඉක්බිතිව එළඹෙන පස්වන වර්ෂය | සියයට 20 යි |

(ආ) "අදාළ දිනය" යන යෙදුමෙන් 1996 නොවැම්බර් මාසයට පෙර නොවූ සහ 1998 අප්‍රේල් මාසයට පසුව නොවූ ද යම් ලිත් මාසයක පළමුවන දිනය වූ ද ඒ ව්‍යවසාය විසින් තෝරාගනු ලැබ ඒ මාසයේ අන්තිම දින සිට දින තිහක් ඉකුත්වීමට පෙර කොමසාරිස් ජනරාල්වරයා වෙත ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබුවා වූ ද දිනය අදහස් වේ :

එසේ වුවද අදාළ දිනය එසේ කොමසාරිස් ජනරාල්වරයාට දැනුම් දී නොමැති අවස්ථාවක, දිනය 1997 අප්‍රේල් මස 1 වන දිනය අදාළ දිනය ලෙස සැලකිය යුතු ය;

(ඇ) 'නව ප්‍රාග්ධන වියදම්' යන යෙදුමෙන් ව්‍යවසාය විසින් දියුණු තාක්ෂණය අත්කර ගැනීම හා භාවිත කිරීම සඳහා යම් අලුත්-

(i) පිරියත, යන්ත්‍ර, සවිකිරීම් හෝ උපකරණ; සහ

(ii) (යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් හැර) (i) වන අනුඡේදයේ ඇතුළත් නොවූ වත්කමක්

මිල දී ගැනීමෙහි ලා දරන ලද වියදම අදහස් වේ :

එසේ වුවද අදාළ දිනයේ හෝ ඊට පෙර ඒ ව්‍යවසායේ වත්කම්වල කොටසක් වූ යම් පිරියත, යන්ත්‍ර, සවිකිරීම් හෝ උපකරණ අදාළ දිනයෙන් පසු ප්‍රතියෝජනය කිරීම සඳහා දරන ලද යම් වියදමක් නව ප්‍රාග්ධන වියදම් වශයෙන් සලකනු නොලැබිය යුතු ය.".

**12.** 1996 අංක 16 දරන පනතින් සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ-

(අ) ඒ උපවගන්තියේ (ඉඉ) ඡේදයේ-

(i) (i) වන අනුඡේදයේ "1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව යම් තැනැත්තකු විසින් අත්කර ගනු ලැබූ" යන වචන හා ඉලක්කම් වෙනුවට "1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1997 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව යම් තැනැත්තකු විසින් අත්කර ගනු ලැබූ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් :

(ii) (i) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(iඅ) 1997 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව යම් තැනැත්තකු විසින් අත්කර ගනු ලැබූ (ii) වන අනුඡේදයෙහි සඳහන් පිරියතක්, යන්ත්‍ර හෝ සවිකිරීම් නොවන) යම් පිරියතක්, යන්ත්‍ර හෝ

සවිකිරීම් සහ ඔහු විසින් කරගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක ඒ පාවිච්චි කිරීමේ දී ගෙවියාමෙන් උද්ගත වන ක්ෂයවීම සඳහා ඒවා අත්කර ගැනීමේ පිරිවැය මත සියයට පණහක අනුප්‍රමාණය අනුව "; සහ

(iii) අතුරු විධානයේ "(i) වන අනුඡේදයේ හෝ (ii) වන අනුඡේදයෙහි හෝ (iii) වන අනුඡේදයෙහි" යන වචන හා ඉලක්කම් වෙනුවට "(i) වන අනුඡේදයෙහි හෝ (iඅ) අනුඡේදයෙහි හෝ (ii) වන අනුඡේදයෙහි හෝ (iii) වන අනුඡේදයෙහි" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් :

(iv) අතුරු විධානයට ඉක්බිතිව ම පහත දැක්වෙන තවදුරටත් වූ අතුරු විධානය එකතු කිරීමෙන් :-

"එසේ වුව ද ඒ තැනැත්තා විසින් කල්බදු ව්‍යාපාරය කරගෙන යන අවස්ථාවක, ඒ කල්බදු ව්‍යාපාරය කරගෙන යාමේ දී ඔහු විසින් අත්කර ගෙන බදු දෙන ලද යම් පිරියතක්, යන්ත්‍ර, සවිකිරීම්, මෝටර් රථයක්, ලොරියක්, බස් රථයක්, ට්‍රැක්ටරයක්, ට්‍රේලරයක් හෝ කාර්යාල ගෘහ භාණ්ඩ සම්බන්ධයෙන් වූ (i), (iඅ) හෝ (ii) අනුඡේදවල සඳහන් යම් දීමනාවක්, 1997 අප්‍රේල් මස 1 වන දිනයෙන් හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, ඒ කල්බදු ව්‍යාපාරයෙන් ලැබෙන ලාභ සහ ආදායම නිශ්චය කිරීමේ දී පමණක් එලෙස අඩු කරනු ලැබිය යුතු ය" :

(ආ) ඒ උපවගන්තියේ (ඉඉඉඉ) ඡේදයේ "ඒ දීමනාව ඒ පරිගණක මෘදුකාංග අත්කර ගැනීමේ පිරිවැයෙන් සියයට තිස්තුනයි තුනෙන් එකකට සමාන මුදල් ප්‍රමාණයක් විය යුතු ය" යන වචන වෙනුවට
"ඒ දීමනාව-

(i) ඒ පරිගණක මෘදුකාංග එලෙස අත්කර ගැනීමට යෙදුනේ 1997 අප්‍රේල් මස 1 වන දිනට ප්‍රථමයෙන් නම්, ඒ පරිගණක මෘදුකාංග අත්කර ගැනීමේ පිරිවැයෙන් සියයට තිස්තුනයි තුනෙන් එකකට සමාන මුදල් ප්‍රමාණයක් : සහ

(ii) ඒ පරිගණක මෘදුකාංග එලෙස අත්කර ගැනීමට යෙදුනේ 1997 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව නම් ඒ පරිගණක මෘදුකාංග අත්කර ගැනීමේ පිරිවැයෙන් සියයට පණහකට සමාන මුදල් ප්‍රමාණයක් විය යුතුය ;" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(ඇ) ඒ උපවගන්තියේ (ච) ඡේදයේ "ඒ සමාගම පිහිටුවීමෙහි ලා දරන ලද වියදම්;" යන වචන වෙනුවට "ඒ සමාගම පිහිටුවීමෙහි ලා හෝ ඇවර කිරීමෙහි ලා දරන ලද වියදම්; " යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (7) වන උපවගන්තියේ (අ) ඡේදයේ i වන අනුඡේදයෙහි "(ඉඉ) ඡේදය යටතේ, හෝ" යන වචන වෙනුවට "(ඉඉ) ඡේදය යටතේ, හෝ (ඉඉඉ) ඡේදය යටතේ හෝ" යන වචන ආදේශ කිරීමෙන් .

**13**. 1994 අංක 21 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ උපවගන්තියේ (ට) ඡේදයේ "1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු" යන වචන හා ඉලක්කම් වෙනුවට " 1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු එහෙත් 1997 අප්‍රේල් මස 1 වන දිනට පෙර" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) ඒ උපවගන්තියේ (ට) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ටට) 1997 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ඔහු විසින් ඇතුළත් වූ යම් ගිවිසුමක් යටතේ යම් තක්සේරු වර්ෂයක දී ගෙවන ලද බදු කුලියේ කොටස—

(i) ඒ ගිවිසුම (ii) වන අනුඡේදයේ සඳහන් පිරියතක්, යන්ත්‍රයක්, සවිකිරීමක් හෝ උපකරණයක් නොවන යම් පිරියතක්, යන්ත්‍රයක්, සවිකිරීමක් හෝ උපකරණයක් සම්බන්ධයෙන් වන විට, ඒ ගිවිසුම යටතේ ගෙවිය යුතු සම්පූර්ණ බදු කුලියෙන් හරි අඩකට සමාන මුදල් ප්‍රමාණයක් ඉක්මවන ප්‍රමාණය ; සහ

(ii) ඒ ගිවිසුම යම් මෝටර් වාහනයක්, ලොරියක්, බස් රථයක්, ට්‍රැක්ටරයක්, ට්‍රේලරයක් සහ කාර්යාල ගෘහ භාණ්ඩ සම්බන්ධයෙන් වන විට, ඒ ගිවිසුම යටතේ ගෙවිය යුතු සම්පූර්ණ බදු කුලියෙන් හතරෙන් එකකට සමාන මුදල් ප්‍රමාණයක් ඉක්මවන ප්‍රමාණය ; ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම.

**14.** 1996 අංක 16 දරන පනතින් සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ—

(අ) (අ) ඡේදයෙහි "මේ ඡේදයේ කාර්ය සඳහා, 1996 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව" යන වචනවල සිට ඒ ඡේදයේ අග දක්වා ඇති සියලු වචන හා ඉලක්කම් ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් :—

"මේ ඡේදයේ කාර්ය සඳහා 1996 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා "පොලිය" යන යෙදුමෙන් පහත දැක්වෙන යම් කාර්යයක් සඳහා ප්‍රයෝජනයට ගනු ලබන ණයකින් ලැබෙන මුදල් මත ගෙවන යම් පොලියක් අදහස් වේ :—

(i) යම් ගොඩනැගිල්ලක් ඉදිකිරීම හෝ මිල දී ගැනීම හෝ යම් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා යම් බිම් කොටසක් මිල දී ගැනීම :

(ii) යම් සමාගමක යම් කොටසක් මිලට ගැනීම :

(iii) යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක යෙදවීම. " :

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයෙහි—

(i) "යම් තක්සේරු වර්ෂයක් තුළ දී යම් වෙළෙඳාමකින්" යන වචනවල සිට "මුදල අඩු කරනු ලැබිය යුතු ය" යන වචන දක්වා වූ සියලු වචන සහ ඉලක්කම් ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් :—

"(ආ) (i) ඒ තක්සේරු වර්ෂය 1997 මාර්තු මස 31 වන දින හෝ ඊට පෙර අවසාන වන යම් තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක, ඒ තක්සේරු වර්ෂය තුළ දී යම් වෙළෙඳාමකින් ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් ඔහු විසින් දරන ප්‍රාග්ධන අලාභයක් හෝ (7) වන උපවගන්තියෙහි සඳහන් අලාභයක් හෝ (7අ) උපවගන්තියෙහි සඳහන් අලාභයක් නොවන අලාභයක් වන්නා වූ ද, අලාභයක් නොව ලාභයක් වූයේ නම් මේ පනත යටතේ හෝ 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත යටතේ තක්සේරු කළ හැකිව තිබුනා වූ ද ඒ පනත් යටතේ ඉකුත් තක්සේරු වර්ෂයක ඔහුගේ ව්‍යවස්ථාපිත ආදායමින් අඩු කරනු නොලැබුවා වූ ද අලාභයක මුදල අඩු කරනු ලැබිය යුතු ය; තවද

(ii) ඒ තක්සේරු වර්ෂය 1997 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක –

(අ) 1997 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන (එහෙත් පළමුව සඳහන් කළ තක්සේරු වර්ෂයට පෙරාතුව ම වූ අවුරුදු හයක කාලය ඇතුළත වන) යම් තක්සේරු වර්ෂයක් තුළදී වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් ඔහු විසින් දරන ලද අලාභයක (ඒ අලාභයේ යම් කොටසක් ප්‍රාග්ධන අලාභයකින්, (7) වන උපවගන්තියේ සඳහන් අලාභයකින්, (7අ) උපවගන්තියේ සඳහන් අලාභයකින් මේ අනුඡේදයේ (ආ) ඡේදයේ සඳහන් අලාභයකින්, 23(1)(ඉඉ) වගන්තියේ සඳහන් ක්ෂයවීම සඳහා වූ යම් දීමනාවකට හෝ 23(1)(ඉඉඉ) වගන්තියේ සඳහන් යම්

දීමනාවකට හෝ 23(1) (ඊ) වගන්තියේ සඳහන් යම් මුදලකට ආරෝපණය කළ හැකි අලාභයකින් සමන්විත වන්නේ නම් එම කොටස නොවන) මුදල; හෝ

(ආ) 1997 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන (එහෙත් පළමුව සඳහන් කළ තක්සේරු වර්ෂයකට පෙරාතුව ම වූ අවුරුදු එකොළහක කාලය ඇතුළත වන) යම් තක්සේරු වර්ෂයක් තුළ දී කෘෂිකාර්මික ව්‍යවසායකින් ඔහු විසින් දරන ලද යම් අලාභයක 23(1)(ඉඉ) වගන්තියේ සඳහන් ක්ෂයවීම සඳහා යම් දීමනාවකට හෝ 23(1)(ඉඉඉ) වගන්තියේ සඳහන් යම් දීමනාවකට හෝ 23(1)(ඊ) වගන්තියේ සඳහන් යම් මුදලකට ආරෝපණය කළ හැකි ඒ අලාභයේ යම් කොටසක් වේ නම්, ඒ කොටස නොවන) මුදල,

ඒ මුදල අලාභයක් නොව ලාභයක් වූයේ නම් මේ පනත යටතේ තක්සේරු කළ හැකිව තිබුනා වූ ද අවස්ථාවෝචිත පරිදි, ඒ අවුරුදු හයේ හෝ අවුරුදු එකොළහේ කාලය තුළ යම් තක්සේරු වර්ෂයක ඔහුගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමින් අඩු කරනු නොලැබුවා වූ ද, මුදලක් වන්නේ නම් අඩු කරනු ලැබිය යුතු ය;

(ඇ) 1997 අප්‍රේල් මස 1 වන දිනයෙන් හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් තුළ දී යම් වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් ඔහු විසින් දරනු ලැබූ 23(1) (ඉඉ) වගන්තියේ සඳහන් ක්ෂයවීම සඳහා වූ යම්

දීමනාවකට හෝ 23(1) (ඉඉඉඉ) වගන්තියේ සඳහන් යම් දීමනාවකට හෝ 23(1)(ඊ) වගන්තියේ සඳහන් යම් මුදලකට ආරෝපණය කළ හැකි වූ ද ඒ අලාභය අලාභයක් නොව, ලාභයක් වූයේ නම්, මේ පනත යටතේ තක්සේරු කළ හැකිව තිබූ සහ මේ පනත යටතේ ඉකුත් තක්සේරු වර්ෂයක ඔහුගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමින් අඩු කරනු නොලැබුවා වූ ද අලාභයක යම් කොටසක් වේ නම්, ඒ කොටස අඩු කරනු ලැබිය යුතු ය : ";

(ඇ) ඒ ඡේදයේ අතුරු විධානයේ (iii) වන ඡේදයේ "වෙනසක් සිදු වී ඇතැයි සලකනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට "වෙනසක් සිදු වී ඇතැයි සලකනු ලැබිය යුතු ය;" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඈ) ඒ ඡේදයේ අතුරු විධානයේ අගට පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :–

"(iv) (ප්‍රාග්ධන අලාභයකට හෝ (7) වන උපවගන්තියේ හෝ (7අ) වන උපවගන්තියේ සඳහන් අලාභයකට ආරෝපණය කළ හැකි අලාභයක් නොවන) 1997 මාර්තු මස 31 වන දිනෙන් හෝ ඊට පෙර අවසන් වන යම් තක්සේරු වර්ෂයක දී ඔහු විසින් දරන ලද යම් අලාභයක මේ ඡේදයේ (i) වන අනුඡේදයේ විධිවිධානවලට අනුකූලව, 1997 මාර්තු මස 31 වන දිනෙන් අවසාන වන තක්සේරු වර්ෂය සඳහා වූ මුළු ව්‍යවස්ථාපිත ආදායමින් අඩු කිරීමෙන් පසු, ශේෂයක් වේ නම්, ඒ ශේෂය, මේ ඡේදයේ (ii) වන අනුඡේදයේ කාර්ය සඳහා, 1998 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන තක්සේරු වර්ෂය තුළ දරන ලද අලාභයක් ලෙස සලකනු ලැබිය යුතු ය.";

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ -

(අ) (අ) ඡේදයේ "17උ වගන්තිය හෝ 17 ඒ වගන්තිය හෝ 22අ වගන්තිය" යන වචන හා ඉලක්කම් වෙනුවට "17උ වගන්තිය හෝ 17ඒ වගන්තිය හෝ 17ඒඒ වගන්තිය හෝ 22අ වගන්තිය" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ආ) (ආ) ඡේදයේ "ඒ මුළු ප්‍රමාණය ම හෝ කොටස ඊළඟට එළඹෙන ඔහුගේ තක්සේරු වර්ෂයේ ව්‍යවස්ථාපිත ආදායමින් අඩු කළ යුතු අතර, එසේ කළ නොහැකි විට ඊළඟට එළඹෙන තක්සේරු වර්ෂයේ ව්‍යවස්ථාපිත ආදායමින් යනාදී පිළිවෙලට අඩු කළ යුතු ය." යන වචන වෙනුවට "ඒ මුළු ප්‍රමාණය හෝ කොටස,-

ඒ නිදහස් කිරීම 1997 මාර්තු මස 31 වන දිනයෙන් හෝ ඊට පෙර අවසන් වන යම් තක්සේරු වර්ෂයක් තුළ අවසන්වන අවස්ථාවක, 1997 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන වර්ෂයේ දී දරන ලද්දා වූ අලාභයක් ලෙස, නැතහොත්

ඒ නිදහස් කිරීම 1997 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පෙර ආරම්භ වන තක්සේරු වර්ෂයක් තුළ අවසන්වන අවස්ථාවක, ඒ නිදහස් කිරීම අවසන් වන තක්සේරු වර්ෂයේ දී දරන ලද්දා වූ අලාභයක් ලෙස

සලකනු ලැබිය යුතු අතර, (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන සලසා ඇති ආකාරයට අඩු කරනු ලැබිය යුතු ය.";

(3) ඒ වගන්තියේ (4අ) උපවගන්තිය අගට පහත දැක්වෙන අතුරු විධානය එකතු කිරීමෙන් -

"එසේ වුවද නිදහස් කරනු ලැබූ කාලය අවසන් වන්නේ කවර තක්සේරු වර්ෂයක් අතරතුර දී ද, ඒ තක්සේරු වර්ෂය අවසානයේ දී ඒ මුළු එකතුවෙන් ඒ එකතු මුදල අඩු කිරීමෙන් පසු යම් ශේෂයක් ඉතිරිවන අවස්ථාවක, ඒ ශේෂය (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ කාර්ය සඳහා, නිදහස් කරනු ලැබූ කාලය අවසන් වන තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම වූ තක්සේරු වර්ෂයේ දී දරන ලද අලාභයක් ලෙස සලකනු ලැබිය යුතු ය.".

15. 1996 අංක 16 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ–

(අ) (අඅඅඅඅඅ) ඡේදයේ "1996 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් එක් ලක්ෂයක දීමනාවක් : සහ " : යන වචන හා ඉලක්කම් වෙනුවට "1996 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් එක් ලක්ෂයක දීමනාවක් : " යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් :

(ආ) ඒ වගන්තියේ (අඅඅඅඅඅ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(අඅඅඅඅඅඅ) 1997 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් රුපියල් එක් ලක්ෂ හතලිස් හතර දහසක දීමනාවක් : සහ";

(ඇ) ඒ උපවගන්තියේ (ආ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ආ) 31 වන වගන්තිය හෝ 31අ වගන්තිය යටතේ ඔහුට හිමිකම් ලැබෙන යම් දීමනාවක එකතුව එයින් අඩුකිරීමෙන් පසු ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ තක්සේරු කළ හැකි ආදායම විය යුතුය. "; සහ

(ඈ) ඒ අතුරු විධානයේ "(අඅඅඅඅ) ඡේදයෙහි හෝ (අඅඅඅඅඅ) ඡේදයෙහි හෝ" යන වචන වෙනුවට "(අඅඅඅඅ) ඡේදයෙහි හෝ (අඅඅඅඅඅ) ඡේදයෙහි හෝ (අඅඅඅඅඅඅ) ඡේදයෙහි හෝ" යන වචන ආදේශ කිරීමෙන් :

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ—

(අ) "31 වන වගන්තිය යටතේ" යන වචන හා ඉලක්කම් ඒ උපවගන්තියේ යෙදී ඇති සෑම තැනකම "31 වන වගන්තිය හෝ 31අ වගන්තිය යටතේ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් :

(ආ) ඒ උපවගන්තියේ පළමුවන අතුරු විධානයේ—

(i) (ඍ) ඡේදයේ "1996 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන වචන හා ඉලක්කම් වෙනුවට "1996 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් :

(ii) ඒ අතුරු විධානයේ (ඍ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(එ) 1997 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් එක් ලක්ෂ හතළිස් හතර දහසක දීමනාවක්." ; සහ

(3) ඒ උපවගන්තියේ දෙවන අතුරු විධානයේ—

(i) (iii) වන අනුඡේදයේ "1995 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් වන විට, රුපියල් හැටදහසකට: සහ" යන වචන හා ඉලක්කම් වෙනුවට "1995 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය වන විට රුපියල් හැට දහසකට" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් :

(ii) (iv) වන අනුඡේදයේ "1996 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් වන විට රුපියල් එක් ලක්ෂයකට" යන වචන හා ඉලක්කම් වෙනුවට "1996 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය වන විට රුපියල් එක් ලක්ෂයකට: සහ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් :

(iii) (iv) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් :—

"(v) ඒ තක්සේරු වර්ෂය 1997 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් වන විට, රුපියල් එක් ලක්ෂ හතලිස් හතර දහසකට.".

16. 31 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 31අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :- ප්‍රධාන ප්‍රඥප්තියෙහි 31අ වගන්තිය ඇතුළත් කිරීම.

"සුදුසුකම් ලබන ආයෝජන සම්බන්ධයෙන් දීමනාවක්.

31අ. (1) මේ වගන්තියේ අනුප්‍රාප්තික විධිවිධානවලට යටත්ව, යම් තක්සේරු වර්ෂයක දී යම් තැනැත්තකු විසින් කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන (2) වන උපවගන්තියේ සඳහන් සෑම සුදුසුකම් ලබන ආයෝජනයක් වෙනුවෙන්, (මෙහි මේ වගන්තියෙහි මින් මතු "ආයෝජන බදු දීමනාව" යනුවෙන් සඳහන් කරනු ලබන) දීමනාවක් 30 වන වගන්තියේ කාර්ය සඳහා, ඒ තක්සේරු වර්ෂය සඳහා වූ ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායමින් අඩු කරනු ලැබිය යුතු ය :

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා—

(අ) යම් තැනැත්තකුට සහ යම් තක්සේරු වර්ෂයකට අදාළව "සුදුසුකම් ලබන ආයෝජනය" යන්නෙන්—

(i) 1996 නොවැම්බර් මස 6 වන දිනට හෝ ඉන් පසුව එහෙත් 1998 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ;

(ii) ඔහු විසින් කරගෙන යනු ලබන යම් බඩු හෝ වෙළෙඳ ද්‍රව්‍ය නිෂ්පාදනය හෝ සෑදීම සඳහා වූ හෝ යම් තොග හෝ සිල්ලර වෙළෙඳාමක් සඳහා වූ හෝ යම් නියමිත සේවයක් සැලසීම සඳහා වූ යම් ව්‍යාපාරයක භාවිතය

සඳහා (24 වන වගන්තිය සමඟ කියවිය යුතු 23 වන වගන්තිය යටතේ ක්ෂයවීම සඳහා දීමනාවක් අඩු කළ හැකි වන්නේ යම් කවර ප්‍රාග්ධන වත්කමක් සම්බන්ධයෙන් ද එවැනි යම් ප්‍රාග්ධන වත්කමක් වන) යම් අලුත් ප්‍රාග්ධන වත්කමක් අත්කර ගැනීමේ දී

ඒ තැනැත්තා විසින් වියදම් කරන ලද යම් මුදලක් අදහස් වේ :

(ආ) යම් තැනැත්තකු විසින් අත්කර ගනු ලැබූ (ඒ තැනැත්තා විසින් කරන ලද යම් සුදුසුකම් ලබන ආයෝජනයක සමන්විත වන ප්‍රාග්ධන වත්කමක් වන) යම් ප්‍රාග්ධන වත්කමක්, ඒ ප්‍රාග්ධන වත්කම අත්කර ගනු ලැබූ දිනයෙන් පසු දවස් තුන්සිය හැට පහක් ඉකුත්වීමට පෙරාතුව (අ) ඡේදයේ (ii) වන අනුඡේදයේ සඳහන් යම් ව්‍යාවසායක භාවිත කරන අවස්ථාවක, ඒ ප්‍රාග්ධන වත්කමට අදාළ සුදුසුකම් වන ආයෝජනය, ඒ අත්කර ගැනීමේ දිනය ඇතුළත් තක්සේරු වර්ෂය තුළ දී කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) (i) සුදුසුකම් ලබන ආයෝජනය, රුපියල් මිලියන දෙසිය පණහකට නොඅඩු මුදලක් වන අවස්ථාවක හෝ ඒ ආයෝජනය කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය ඇතුළත පිහිටි සියලුම මහ නගර සභාවල පාලන සීමාවලින් පිටත පිහිටුවන ලද යම් ව්‍යාවසායක කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ ආයෝජනය සම්බන්ධයෙන් වන ආයෝජන බදු දීමනාව ඒ ආයෝජනයේ සමස්තයට සමාන මුදලක් විය යුතු ය; තව ද

(ii) රුපියල් මිලියන දෙසිය පණහට අඩු මුදලක් වන අවස්ථාවක සහ ඒ ආයෝජනය කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය ඇතුළත පිහිටි යම් මහ නගර සභාවක පාලන සීමාව ඇතුළත පිහිටුවන ලද යම් ව්‍යවසායක කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ ආයෝජනය සම්බන්ධයෙන් වන ආයෝජන බදු දීමනාව ඒ ආයෝජනයෙන් සියයට හැත්තෑ පහකට සමාන මුදලක් විය යුතු ය.

(4) යම් සුදුසුකම් ලබන ආයෝජනයක් කරන ලද්දේ යම් තක්සේරු වර්ෂයක් තුළ දී ද ඒ තක්සේරු වර්ෂය සඳහා වූ යම් තැනැත්තකුගේ බදු අය කළ හැකි ආදායමින්, ඒ සුදුසුකම් ලත් ආයෝජනයට අදාළව අඩු කළ යුතු ආයෝජන බදු දීමනාව—

(i) ඒ සුදුසුකම් ලබන ආයෝජනය (3) වන උපවගන්තියේ (i) වන ඡේදයේ සඳහන් යම් සුදුසුකම් ලබන ආයෝජනයක් වන අවස්ථාවක, ඒ තක්සේරු කළ හැකි ආදායමින් සියයට හැත්තෑ පහකට සමාන මුදලක් හෝ ඒ මුළු සුදුසුකම් ලබන ආයෝජනය යන මේ දෙකෙන් කවර වූ හෝ අඩු මුදල:

(ii) ඒ සුදුසුකම් ලබන ආයෝජනය, (3) වන උපවගන්තියේ (ii) වන ඡේදයේ සඳහන් යම් සුදුසුකම් ලබන ආයෝජනයක් වන අවස්ථාවක, ඒ තක්සේරු කළ හැකි ආදායමින් සියයට පණහකට සමාන මුදලක් හෝ ඒ මුළු සුදුසුකම් ලබන ආයෝජනය යන මේ දෙකෙන් කවර වූ හෝ අඩු මුදල

විය යුතු ය.

(5) ආයෝජන බදු දීමනාව (4) වන උපවගන්තියට අනුකූලව අඩු කිරීමෙන් පසු එහි යම් ශේෂයක් තිබේ නම්, ඒ ශේෂය ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂය සඳහා ඉදිරියට ගෙන යා යුතු ය; එසේ ඉදිරියට ගෙන එනු ලැබූ ශේෂය, ඒ ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂය සඳහා වන ආයෝජන බදු දීමනාවක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ආයෝජන බදු දීමනාවේ සම්පූර්ණ මුදල අඩු කරනු ලබන තෙක් එලෙස අඩුකිරීම් කරගෙන යා යුතු ය.

(6) මේ වගන්තියේ විධිවිධාන යම් ප්‍රාග්ධන වත්කමක් අත්කර ගැනීමේ දී ආයෝජනය කළ මුදල් ප්‍රමාණයට අදාළව —

(i) ඒ වත්කම්, දියුණු තාක්ෂණය භාවිත කිරීම සඳහා ආණ්ඩුව විසින් අනුමත කරන ලද දිරිගැන්වීමේ යෝජනා ක්‍රමය අනුව රේගු ගාස්තු වල යම් අඩුකිරීමකට හෝ අත්හැරීමකට හිමිකම ලබන්නේ නම්, ඒ අඩුකිරීමට හෝ අත්හැරීමට ඇති හිමිකම ප්‍රයෝජනයට ගෙන ඇත්නම් : හෝ

(ii) ඒ වත්කම පාවිච්චි කරන ලද්දේ හෝ පාවිච්චි කරනු ලබන්නේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ (ii) වන අනුඡේදයේ සඳහන් යම් ව්‍යාවසායක ද, එකී ව්‍යාවසායේ 1996 නොවැම්බර් මස 6 වන දිනයෙන් ආරම්භව 1999 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන කාල පරිච්ඡේදය තුළ දී වන කිසියම් කාල පරිච්ඡේදයක් සඳහා වන (3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව) ලාභ සහ ආදායම මුළුමනින්ම හෝ එහි යම් කොටසක් ආදායම් බද්දෙන් යම් නිදහස්වීමක් ලැබීමට හිමිකම් ලබන්නේ නම් : හෝ

(iii) යම් ප්‍රාග්ධන වත්කමක් අත්කර ගැනීමේ දිනයේ සිට ගණන් බලන ලද අවුරුදු තුනක කාලයක් ඉකුත් වීමට කලින් ඒ ප්‍රාග්ධන වත්කම බැහැර කරනු ලැබුවේ නම් ඒ සම්බන්ධයෙන්

අදාළ නොවිය යුතු ය.

(7) (i) යම් ප්‍රාග්ධන වත්කමක් අත්කර ගැනීමේ දිනයෙන් පසු, දවස් තුන්සිය හැටපහක් ඉකුත්වීමට පෙරාතුව (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ (ii) වන අනුඡේදයේ සඳහන් යම් ව්‍යවසායක එය යොදවා නොමැති ; නැතහොත්

(ii) (6) වන උපවගන්තියේ සඳහන් කර ඇත්තා වූ ද

යම් ප්‍රාග්ධන වත්කමකට අදාළව යම් තැනැත්තකුගේ තක්සේරු කළ හැකි ආදායමින් ආයෝජන බදු දීමනාවක් අඩුකර ඇති අවස්ථාවක් වේ නම්, එවිට, මේ පනතේ කුමක් සඳහන්ව තිබුණ ද, ඒ දීමනාව ප්‍රදානය කරන ලද තක්සේරු වර්ෂය සම්බන්ධයෙන්, ඒ දීමනාව ප්‍රදානය නොකරන ලද්දේ නම්, ඒ දීමනාව ලැබූ තැනැත්තා යටත් විය යුතු ආදායම් බද්ද සහ ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහුගෙන් අයකරන ලද ආදායම් බද්ද අතර වෙනස සමත්විත වන අතිරේක තක්සේරුවක් ඒ තැනැත්තා සම්බන්ධයෙන් කරනු ලැබිය යුතු අතර, ඒ අනුව, තක්සේරු දැන්වීම, අභියාචනය සහ වෙනත් කාර්ය පටිපාටියට අදාළ මේ පනතේ විධිවිධාන ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(8) මේ වගන්තියේ කාර්ය සඳහා –

(අ) "යම් නිශ්චිත සේවයක් සැලසීම" යන යෙදුමෙන් –

(i) විදුලිය, ගෑස්, පාරිසරික ආරක්ෂක සේවා, රෝහල් සේවා, පරිගණක මෘදුකාංග, පරිගණක ක්‍රමලේඛ හෝ පරිගණක පද්ධති සැපයීම: හෝ

(ii) විදුලි සංදේශ සේවා සැලසීම, පරිගණක යෙදුම් පිළිබඳ පුහුණුව, ප්‍රවාහණය, නැව් හෝ ගුවන්යානා අලුත්වැඩියා කිරීම, නැව් බඩු කන්ටේනර් යථාවත් කිරීම, ගබඩා කරණය හා නිවාස ඉදිකිරීම ; හෝ

(iii) ලංකා සංචාරක මණ්ඩලයේ අනුමතය ඇතිව සංචාරකයන් සඳහා හෝටල් මෙහෙයවීම

අදහස් වේ :

(ආ) යම් ප්‍රාග්ධන වත්කමකට සහ යම් තැනැත්තකුට අදාළව " අත්කර ගැනීමේ දිනය" යන යෙදුමෙන්, ඒ තැනැත්තා විසින් ඒ ප්‍රාග්ධන වත්කම අත්කර ගනු ලැබූ දිනය හෝ ඒ තැනැත්තා විසින් ඒ වත්කම අත්කර ගැනීම සඳහා යොදා ඇති වැඩ පිළිවෙලට අදාළව කොමසාරිස්-ජනරාල්වරයා හමුවෙහි ඉදිරිපත් කරන ලද යම් ලේඛනගත සාක්ෂියක් කෙරෙහි සැලකිල්ල ඇතිව, ඔහු විසින් පිළිගනු ලැබූ වෙනත් දිනයක් අදහස් වේ :

(ඇ) යම් ප්‍රාග්ධන වත්කමකට අදාළව "බැහැර කිරීම" යන යෙදුමෙහි 23(7) වන වගන්තියෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය :

(ඈ) යම් ප්‍රාග්ධන වත්කමකට අදාළව "අලුත්" යන යෙදුමෙන්, ඒ ප්‍රාග්ධන වත්කම අත්කර ගැනීමේ දිනයට පෙරාතුව ශ්‍රී ලංකාව තුළ දී භාවිතයට ගෙන නොමැති බව ලේඛනගත සාක්ෂි මගින් කොමසාරිස්-ජනරාල්වරයා සෑහීමට පත් වන ආකාරයෙන් ඔප්පු කරනු ලැබූ යම් ප්‍රාග්ධන වත්කමක් අදහස් වේ.

(ඉ) "ප්‍රාග්ධන වත්කම්" යන යෙදුමෙන් යම් ගොඩනැගිල්ලක්, සවිකිරීමක්, මෙවලමක්, හෝ යම් මෝටර් රථයක් හැර යම් පිරියතක්, යන්ත්‍රයක් හෝ උපකරණයක් අදහස් වේ:

(ඊ) "ක්ෂයවීම සඳහා දීමනාව" යන යෙදුමෙන් 23(7) වන වගන්තියෙහි ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය.

(උ) "මෝටර් රථය" යන්නෙන්, මෝටර් ගිලන් රථයක්, ලොරියක්, ට්‍රැක්ටරයක්, අත් ට්‍රැක්ටරයක්, ට්‍රේලරයක් හෝ තැනැත්තන් තිස් දෙනකුට නොඅඩු සංඛ්‍යාවක් ප්‍රවාහණය සඳහා සාදන ලද මෝටර් කෝච් රථයක් නොවන යාන්ත්‍රිකව ධාවනය කෙරෙන යම් වාහනයක් අදහස් වේ ;

(ඌ) "රෝහල් සේවා" යන්නෙන්, (220 වන අධිකාරය වන) සාත්තු නිවාස විධිමත් කිරීමේ පනත යටතේ, නේවාසික රෝගීන් සඳහා, ලියාපදිංචිකර ඇති ආයතනයක් විසින් සලස්වා දීමට බලය දී ඇති සේවා අදහස් වේ.

17. 1996 අංක 16 දරන පනතින් සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :– ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

(i) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි –

(අ) (ix) වන අනුඡේදයේ "1996 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක්" යන වචන හා ඉලක්කම් වෙනුවට "1996 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(ආ) ඒ ඡේදයේ අගට පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් :-

"(x) 1997 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ ii ළු කොටසෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව;".

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු විධානයේ-

(අ) (vi) වන අනුඡේදයේ "1995 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා රුපියල් හැට දහසක් : සහ" යන වචන හා ඉලක්කම් වෙනුවට "1995 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා රුපියල් හැට දහසක්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් :

(ආ) (vii) වන අනුඡේදයේ "1996 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් රුපියල් එක් ලක්ෂයක්.", යන වචන හා ඉලක්කම් වෙනුවට "1996 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් රුපියල් එක්ලක්ෂයක් : සහ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් : සහ

(ඇ) (vii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(viii) 1997 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් එක් ලක්ෂ හතලිස් හතර දහසක්" : සහ

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි-

(අ) (ආ) ඡේදයේ "රුපියල් පහළොස් ලක්ෂය" යන වචන වෙනුවට "රුපියල් දහ අට ලක්ෂය" යන වචන ආදේශ කිරීමෙන් :

(ආ) (ix) වන ඡේදයේ "1996 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ IIඋ කොටසෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව." යන වචන හා ඉලක්කම් වෙනුවට "1996 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ IIඋ කොටසෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව ; හෝ" සහ

(ඇ) (ix) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :-

"(x) 1997 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් මේ පනතේ උපලේඛනයේ IIඌ කොටසෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව;".

18. 1996 අංක 16 දරන පනතින් සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 32ඉඉඉ වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ "1996 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක්." යන වචන හා ඉලක්කම් වෙනුවට "1996 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 32ඉඉඉ වගන්තිය සංශෝධනය කිරීම.

19. 1995 අංක 27 දරන පනතින් සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 33අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 33අ වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි "ඒ අඩු කිරීම," යන වචනවල සිට ඒ වගන්තියේ අවසානය දක්වා වූ සියලු වචන හා ඉලක්කම් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"ඒ තක්සේරු වර්ෂය 1997 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව අවසන් වන යම් තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක, ඒ අඩු කිරීම–

(i) 33(1)(අ) වගන්තිය යටතේ ; සහ

(ii) 32ඊ වගන්තිය හෝ 32ඌ වගන්තිය හෝ 32ඔ වගන්තිය හෝ 32ක වගන්තිය හෝ 32ග වගන්තිය යටතේ

ඒ සමාගම විසින් ඒ තක්සේරු වර්ෂයේ දී ගෙවිය යුතු සම්පූර්ණ බද්දේ එකතුවෙන් සියයට පණහක් නොඉක්මවිය යුතු ය:"; සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ සමාගම විසින් 33(1)(අ) වගන්තිය යටතේ ගෙවිය යුතු බද්දෙන් සියයට පණහක් නොඉක්මවිය යුතු ය." යන වචන හා ඉලක්කම් වෙනුවට "1997 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ සමාගම විසින් 33(1)(අ) වගන්තිය යටතේ ගෙවිය යුතු බද්දෙන් සියයට පණහක් නොඉක්මවිය යුතු ය." යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය සංශෝධනය කිරීම.

**20.** 1996 අංක 16 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තියෙහි (1අ) උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ උපවගන්තියේ (vi) වන ඡේදයේ "ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා රුපියල් හැට දහසක් : සහ" යන වචන වෙනුවට "ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා රුපියල් හැට දහසක්"; යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ උපවගන්තියේ (vii) වන ඡේදයේ "1996 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් එක් ලක්ෂයක්". යන වචන හා ඉලක්කම් වෙනුවට "1996 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා රුපියල් එක් ලක්ෂයක්: සහ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් : සහ

(3) ඒ උපවගන්තියේ අගට පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :-

"(viii) 1997 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් එක් ලක්ෂ හතළිස් හතර දහසක්.".

**21.** 1982 අංක 27 දරන පනතින් සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 81අ වගන්තියේ (1) වන උපවගන්තියෙහි "ඒ ගෙවීමේ මුදල් ප්‍රමාණයෙන් සියයට තිස්තුනයි තුනෙන් එකකට සමාන ආදායම් බද්දක් ඒ ගෙවීමෙන් අඩු කරනු ලැබිය යුතු ය." යන වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 81අ වගන්තිය සංශෝධනය කිරීම.

" ඒ ගෙවීමේ මුදල් ප්‍රමාණයෙන්-

(i) ඒ ගෙවීම, 1997 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව කරනු ලැබූ අවස්ථාවක සියයට තිස් තුනයි තුනෙන් එකකට සමාන ආදායම් බද්දක්; සහ

(ii) ඒ ගෙවීම 1997 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව කරනු ලැබූ අවස්ථාවක සියයට පහළොවකට සමාන ආදායම් බද්දක්

ඒ ගෙවීමෙන් අඩු කරනු ලැබිය යුතු ය." .

**22.** 1996 අංක 16 දරන පනතින් සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 99 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 99 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) (අ) මාසයකට රුපියල් දොළොස් දහසකට හෝ වර්ෂයකට රුපියල් එක් ලක්ෂ හතළිස් හතර දහසකට වැඩි පාරිශ්‍රමිකයක් ලබන යම් පුද්ගලයකු ; හෝ

(ආ) ශ්‍රී ලංකාවෙහි කරනු ලබන සේවය වෙනුවෙන් මාසයකට රුපියල් අසූපහකට හෝ වර්ෂයකට රුපියල් එක් දහසකට වැඩි පාරිශ්‍රමිකයක් ලබන නිර්වාසික පුද්ගලයකු,

සේවයෙහි නියුක්ත කරන්නා වූ ද, 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 107ඇ වගන්තිය යටතේ හෝ මේ පනතේ මේ පරිච්ඡේදය යටතේ හෝ කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම්දීමක් කර නොමැත්තා වූ ද, සෑම සේවායෝජකයකු විසින් ම (මේ පරිච්ඡේදයේ මින් මතු "නියමිත සේවානියුක්තයා" යනුවෙන් සඳහන් කරනු ලබන) එවැනි යම් පුද්ගලයකු තම සේවයෙහි සිටින බව 1997 සැප්තැම්බර් මස 30 වන දින ඉකුත්වීමට පෙර කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දීමක් කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 113 වන වගන්තිය සංශෝධනය කිරීම.

**23**. ප්‍රධාන ප්‍රඥප්තියේ 113 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) "සේවායෝජක" යන්නෙහි අර්ථකථනයෙහි "ලේකම්, කළමනාකරු හෝ අන් ප්‍රධාන නිලධරයා" යන වචන වෙනුවට, "අධ්‍යක්ෂවරයා, ලේකම්වරයා, කළමනාකරු හෝ අන් ප්‍රධාන නිලධරයා" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) "ගෙවීමේ කාලසීමාව" යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :-

"ප්‍රධාන නිලධරයා" යන්න යම් සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ සමාගම හෝ පුද්ගල මණ්ඩලය සමඟ තමාගේ කිසිම සම්බන්ධතාවක් නොමැති බව නැතහොත් ඒ සමාගමේ හෝ පුද්ගල මණ්ඩලයේ ප්‍රධාන නිලධරයා ශ්‍රී ලංකාවෙහි නේවාසික වෙනත් යම් තැනැත්තකු බව ඔහු විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ සමාගම හෝ පුද්ගල මණ්ඩලය වෙනුවෙන් මේ පරිච්ඡේදයේ යම් විධිවිධානයක් යටතේ හෝ xxi වන පරිච්ඡේදයේ යම් විධිවිධානයක් යටතේ දැන්වීමක් දී ඇති යම් තැනැත්තකු ඉන් අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 113අ වගන්තිය සංශෝධනය කිරීම.

**24**. 1994 අංක 21 දරන පනතින් සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 113අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ උපවගන්තියේ (1) වන ඡේදයේ "1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක, එසේ ගෙවිය යුතු පොලියෙන් සියයට විස්සක අනුප්‍රමාණයක්: සහ" යන වචන හා ඉලක්කම් වෙනුවට "1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක, එසේ ගෙවිය යුතු පොලියෙන් සියයට විස්සක අනුප්‍රමාණයක් : " යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් :

(2) ඒ උපවගන්තියේ (ii) වන ඡේදයේ "ඒ තක්සේරු වර්ෂය 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක, එසේ ගෙවිය යුතු පොලියෙන් සියයට පහළොවක අනුප්‍රමාණයක්" යන වචන හා ඉලක්කම් වෙනුවට "ඒ තක්සේරු වර්ෂය 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1997 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක, එසේ ගෙවිය යුතු පොලියෙන් සියයට පහළොවක අනුප්‍රමාණයකින් ; සහ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(3) ඒ උපවගන්තියේ (ii) වන ඡේදයට ඉක්බිතිව මෙහි පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(iii) ඒ තක්සේරු වර්ෂය 1997 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක, එසේ ගෙවිය යුතු පොලියෙන් සියයට දහයක අනුප්‍රමාණයක්.".

**25**. 1985 අංක 56 දරන පනතින් ඇතුළත් කරන ලද ප්‍රධාන ප්‍රඥප්තියේ 113ඇ වගන්තියේ (4) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි "මේ පනත යටතේ ආදායම් බදු අයකළ යුතු තැනැත්තන්ට තක්සේරු වර්ෂයක දී එය විසින් ගෙවන ලද පොලිය" යන වචන වෙනුවට "යම් තක්සේරු වර්ෂයක් තුළ දී යම් තැනැත්තකුට ගෙවන ලද පොලිය" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 113ඇ වගන්තිය සංශෝධනය කිරීම.

**26**. 1996 අංක 16 දරන පනතින් සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 113ඔ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 113ඔ වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි "නිශ්චිත ගාස්තුවෙන් සියයට තුනක අනුප්‍රමාණයක් අනුව ආදායම් බද්දක් අඩු කරනු ලැබිය යුතු ය." යන වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(i) ඒ තක්සේරු වර්ෂය 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1997 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක ඒ නිශ්චිත ගාස්තුවෙන් සියයට තුනක අනුප්‍රමාණයක් අනුව ; සහ

(ii) ඒ තක්සේරු වර්ෂය 1997 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක, ඒ නිශ්චිත ගාස්තුවෙන් සියයට පහක අනුප්‍රමාණයක් අනුව

ආදායම් බද්දක් අඩු කරනු ලැබිය යුතුය.";

(2) (2) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි "තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් වෙනුවෙන්-" යන වචන ඉවත් කොට ඒ වෙනුවට "තමා වෙනුවෙන් හෝ වෙනත් යම් තැනැත්තකු හෝ තැනැත්තන් හෝ හවුල් ව්‍යාපාරයක් හෝ හවුල් ව්‍යාපාර වෙනුවෙන්-" යන වචන ආදේශ කිරීමෙන්.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 113ක වගන්තිය සංශෝධනය කිරීම.

**27**. ප්‍රධාන ප්‍රඥප්තියේ 113ක වගන්තියේ (1) වන උපවගන්තියෙහි "1993 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක්" යන වචන හා ඉලක්කම් ඉවත් කොට ඒ වෙනුවට "1993 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව එහෙත් 1997 අප්‍රේල් මස 1 වන දිනට පෙරතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 113ග වගන්තිය සංශෝධනය කිරීම.

**28**. ප්‍රධාන ප්‍රඥප්තියේ 113ග වගන්තියේ "1993 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක්" යන වචන හා ඉලක්කම් ඉවත් කොට ඒ වෙනුවට "1993 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව එහෙත් 1997 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 113ච වගන්තිය සංශෝධනය කිරීම.

**29**. ප්‍රධාන ප්‍රඥප්තියේ 113ච වගන්තියේ "1993 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන වචන හා ඉලක්කම් ඉවත් කොට ඒ වෙනුවට "1993 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව එහෙත් 1997 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**30**. ප්‍රධාන ප්‍රඥප්තියේ 113ඩ වගන්තියේ "ඒ සේවායෝජකයා විසින් ගෙවනු ලැබුවා වූ ද" යන වචන ඉවත් කොට ඒ වෙනුවට "ඒ සේවායෝජකයා විසින් 113ක වගන්තියේ විධිවිධානවලට අනුකූලව ගෙවනු ලැබුවා වූ ද" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 113ඩ වගන්තිය සංශෝධනය කිරීම.

**31**. ප්‍රධාන ප්‍රඥප්තියේ 151 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (iii) වන ඡේදයෙහි "103 වන වගන්තියෙහි (අ), (ආ), (ඇ), (ඈ) හෝ (ඉ) අනුඡේදවල" යන වචන හා ඉලක්කම් වෙනුවට "103 වන වගන්තියෙහි (අ), (ආ), (ඇ), (ඈ) හෝ (ඉ) අනුඡේදවල හෝ 113අ වගන්තියේ (2) වන උපවගන්තියේ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 151 වන වගන්තිය සංශෝධනය කිරීම.

**32**. 1996 අංක 16 දරන පනතින් සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ පළමු වන උපලේඛනය සංශෝධනය කිරීම.

(1) උපලේඛනයේ IIඋ කොටසෙහි "1996 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි විය යුතුය:-" යන වචන හා ඉලක්කම් වෙනුවට "1996 අප්‍රේල් 1 වන දිනෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි විය යුතුය:-" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් :

(2) ඒ උපලේඛනයේ IIඋ කොටසට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :-

"IIඌ කොටස

1997 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි විය යුතු ය :-

| | |
|---|---|
| බදු අයකළ හැකි ආදායමේ පළමු රු. 100,000 මත | සියයට 10 |
| බදු අයකළ හැකි ආදායමේ ඊළඟ රු.100,000 මත | සියයට 15 |
| බදු අයකළ හැකි ආදායමේ ඊළඟ රු. 100,000 මත | සියයට 25 |
| බදු අයකළ හැකි ආදායමේ ශේෂය මත | සියයට 35"; |

(3) ඒ උපලේඛනයේ IV වන කොටස මෙයින් පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ :-

(අ) ඒ කොටසේ (ඇ) ඡේදයෙහි "1990 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා-" යන වචන හා ඉලක්කම් වෙනුවට "1990 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1997 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ කොටසේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(ඈ) 1997 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා-

පළමුවන රු. 400,000 මතනැත

ඊළඟ රු. 100,000 මත සියයට 5

ඊළඟ රු. 100,000 මත සියයට 10

ශේෂය මත සියයට 15".

ප්‍රධාන ප්‍රඥප්තියේ හත් වන උපලේඛනය සංශෝධනය කිරීම.

**33.** 1996 අංක 16 දරන පනතින් සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ හත්වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

(1) "1994 අප්‍රේල් 1 වන දින ආරම්භ වන සෑම තක්සේරු වර්ෂය සඳහා අත්තිකාරම් සමාගම් බදු අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි විය යුතු යː-" යන වචන හා ඉලක්කම් වෙනුවට "1994 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1997 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහාම අත්තිකාරම් සමාගම් බදු අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි විය යුතු ය :-" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් :

(2) ඒ උපලේඛනය අගට පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් :-

"1997 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා ම අත්තිකාරම් සමාගම් බදු අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි විය යුතුය :-

(i) (අ) 32ඊ වගන්තියේ හෝ 32උ වගන්තියේ හෝ 32ඔ වගන්තියේ හෝ 32ක වගන්තියේ හෝ 32ග වගන්තියේ හෝ විධිවිධානවලට අනුකූලව බදු අයකරනු ලබන ලාභ හැර, වෙනත් ලාභවලින් නිල ලැයිස්තුගත පොදු සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදා හැරීමක මුදලට සමාන මුදල මත : සියයට 54

(ආ) 32උ වගන්තියේ, 32ඔ වගන්තියේ හෝ 32ක වගන්තියේ විධිවිධානවලට අනුකූලව බදු අයකරනු ලබන ලාභවලින් නිල ලැයිස්තුගත පොදු සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදා හැරීමක මුදලට සමාන මුදල මත : සියයට 17

(ඇ) 32ඊ වගන්තියේ විධිවිධානවලට අනුකූලව බදු අය කරනු ලබන ලාභවලින් නිල ලැයිස්තුගත සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදාහැරීමක මුදලට සමාන මුදල මත : සියයට 11

(ii) (අ) 32ඊ වගන්තියේ හෝ 32උ වගන්තියේ හෝ 32ඔ වගන්තියේ හෝ 32ක වගන්තියේ හෝ 32ග වගන්තියේ විධිවිධානවලට අනුකූලව බදු අය කරනු ලබන ලාභ හැර, වෙනත් ලාභවලින් ඒකක භාරයක් විසින් හෝ අන්‍යොන්‍ය අරමුදලක් විසින් හෝ නිල ලැයිස්තුගත පොදු සමාගමක් නොවන වෙනත් යම් සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදාහැරීමක මුදලකට සමාන මුදල මත : සියයට 27

(ආ) 32උ෴ වගන්තියේ හෝ 32ඔ වගන්තියේ හෝ 32ක වගන්තියේ හෝ 32ග වගන්තියේ විධිවිධානවලට අනුකූලව බදු අය කරනු ලබන ලාභවලින් ඒකක භාරයක් විසින් හෝ අන්‍යෝන්‍ය අරමුදලක් විසින් හෝ නිල ලැයිස්තු ගත පොදු සමාගමක් නොවන වෙනත් සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදාහැරීමක මුදලකට සමාන මුදල මත : සියයට 8

(ඇ) 32ඊ වගන්තියේ විධිවිධානවලට අනුකූලව බදු අය කරනු ලබන ලාභවලින් ඒකක භාරයක් විසින් හෝ අන්‍යෝන්‍ය අරමුදලක් විසින් හෝ නිල ලැයිස්තු ගත පොදු සමාගමක් නොවන වෙනත් සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදාහැරීමක මුදලට සමාන මුදල මත : සියයට 5".

අතීතයට බලපෑම.

**34.** (1) මේ පනතේ 4(1) වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 9(1) (ආආ) වගන්තියෙහි කරන ලද සංශෝධනය සියලු කාර්ය සඳහා 1995 නොවැම්බර් මස 22 වන දින බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ 14(1) (අ) වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තියට කරන ලද සංශෝධන සියලු කාර්ය සඳහා 1996 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ 16 වන වගන්තිය සියලු කාර්ය සඳහා 1996 නොවැම්බර් 6 වන දින බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) මේ පනතේ 2(2) හා 4(2) සිට 4(6) දක්වා වගන්ති මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 4(1) (ඇ), 9(1) (ආආආ), සහ 9(i) (ච) වගන්තිවලට කරන ලද සංශෝධන සහ ප්‍රධාන ප්‍රඥප්තියෙහි 9(1) (ජ) වගන්තිය ඇතුළත් කිරීම සියලු කාර්ය සඳහා 1997 අප්‍රේල් මස 1 වන දින බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) මේ පනතේ 12 වන, 13 වන, 14 වන, 15 වන, 17 වන, 18 වන, 19 වන, 20 වන, 21වන, 23 වන, 25 වන, 26 වන, 27 වන, 28 වන හා 29 වන වගන්ති මගින් ප්‍රධාන ප්‍රඥප්තියෙහි 23 වන, 24 වන, 29 වන, 30 වන, 32 වන, 32ඉඉඉ වන, 33අ වන, 73 වන, 81අ වන, 113අ වන, 113ඔ වන, 113ක වන, 113ග වන, 113ච වන, 113ඩ වන වගන්තිවලට කරන ලද සංශෝධන සියලු කාර්ය සඳහා 1997 අප්‍රේල් 1 වන දින බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) මේ පනතේ 32 වන හා 33 වන වගන්ති මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන හා හත්වන උපලේඛනවල කරන ලද සංශෝධන 1997 අප්‍රේල් මස 1 වන දින බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**35**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.